# වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
வடமேல் மாகாண சுகாதார சேவைகள் திணைக்களம்
Department of Health Services – Northwestern Province

සෞඛ්‍ය සංකීර්ණය, මීගමු පාර, කුරුණෑගල. 60000
சுகாதார வளாகம் நீர்கொழும்பு வீதி குருநாகல் 60000
Health Complex. Negombo Road, Kurunegala. 60000
Web: www.healthdept.nw.gov.lk
E-Mail: info@healthdept.nw.gov.lk


මගේ අංකය / எனது இல / My No : NWP/PDHS/EngE/1
ඔබේ අංකය / உமது இல. / Your No :
දිනය / திகதி / Date : 2023 පෙබරවාරි 02

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
කුරුණෑගල/පුත්තලම,
සියලුම වෛද්‍ය අධිකාරී වරුන්,
සියලුම ආයතන ප්‍රධානීන්.

**වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් සියලුම ආයතන වල පරිභෝජනය අඩු කර ගැනීම හා විදුලි බිල්පත් වල තොරතුරු ලබා ගැනීම**

වර්තමානයෙහි රටෙහි පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් සියලුම ආයතන වල පරිභෝජනය අවම කර ගැනීමට හැකි සෑම පියවරක්ම ඔබ විසින් අනුගමනය කරන ලෙස දන්වා සිටිමි (ඇමුණුම 1 බලන්න).

තවද, සියලුම ආයතන වල විදුලි බිල්පත් දත්ත විශ්ලේෂණය කිරීමට අවශ්‍ය වන බැවින් 2023 ජනවාරි මස සිට විදුලි බිල්පතෙහි ඡායා රූපයක් වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙහි විදුලි ඉංජිනේරු අංශයෙහි විද්‍යුත් තැපැල් ලිපිනය වන elecengunit.pdhsnwp@gmail.com වෙත සෑම මසකම දහවන (10) දිනට පෙර යොමු කරන ලෙස දන්වා සිටිමි.

.............................

වෛද්‍ය එම්. කේ. සම්පත් ඉන්දික කුමාර,
වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,
කුරුණෑගල.

වෛද්‍ය එම්.කේ. සම්පත් ඉන්දික කුමාර
MBBS, MSc MD, MCMA
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
වයඹ පළාත,
කුරුණෑගල.

Approved
Website / WhatsApp / SMS

**ඇමුණුම 1: බලශක්ති සංරක්ෂණ ක්‍රියා මාර්ග**

බල ශක්ති සංරක්ෂණය සඳහා සෑම විටම විශේෂ අවධානයක් යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ. කාර්යාල වල නිලධාරීන් නොමැති අවස්ථාවලදී සියලුම විදුලි උපකරණ ක්‍රියා විරහිත කර තැබීමට කටයුතු කල යුතු අතර, ඒ සඳහා කටයුතු කිරීමට කාර්යාල කාර්ය සහායකයින් දැනුවත් කල යුතුය. නිලධාරීන් සිය කාර්යාල වලින් පිටවන විට සියලුම විදුලි උපකරණ ක්‍රියා විරහිත කිරීමට වග බලා ගත යුතුය.

එසේම විදුලි උපකරණ මිළදී ගැනීමේදී ඒවායේ බල ශක්ති කාර්යක්ෂමතාවය, ජීවන චක්‍ර වියදම් සහ පරිසර හිතකාමී බව සැලකිලිමත් වීමට වග බලා ගත යුතුය.

කාර්යාල වල බල ශක්ති සංරක්ෂණය සඳහා ගත හැකි අනෙකුත් ක්‍රියා මාර්ග පහත දැක්වේ.

<u>ආලෝකකරණය</u>

1. අනවශ්‍ය විදුලි පහන් නිවා දැමීම. මේ සඳහා විදුලි පහන් වෙන වෙනම නිවා දැමිය හැකි පරිදි සුවිච් සකසා ගැනීම.
2. හැකි සෑම අවස්ථාවකදීම බලශක්ති ලේබලයක් සහිත LED විදුලි පහන් භාවිතා කිරීම.
3. ස්වභාවික ආලෝකය හැකි සෑම විටම භාවිතා කිරීම.
4. නව ඉදිකිරීම් වලදී හැකි සෑම විටම, ස්වභාවික ආලෝකය භාවිතාකල හැකි අයුරින් ගොඩනැගිලි සැලසුම් සැකසීම.
5. හැකි සෑම විටම බිත්ති ආලේපනය සඳහා ලා වර්ණ භාවිතා කිරීම.
6. හැකි සෑම විටම මේස ලාම්පු භාවිතා කර සාමාන්‍ය විදුලි පහන් නිවා දැමීමට හැකි වන සේ කටයුතු කිරීම.

<u>වායු සමීකරණ</u>

ගොඩනැගිලි වල බල ශක්ති පාරිභෝජනයෙන් 60% - 70% ක ප්‍රමාණයක් වායු සමීකරණය සඳහා වැය වන නිසා වායු සමීකරණ යන්ත්‍රවල/ පද්ධති වල බලශක්ති පාරිභෝජනය සම්බන්ධයෙන් විශේෂ අවධානයකින් කටයුතු කල යුතු වේ.

1. උදෑසන කාලයේදී ජනෙල් විවෘත කර තබා බාහිර වාතාශ්‍රය ප්‍රයෝජනයට ගෙන, කාර්යාලය ආරම්භ කර පැයකට පමණ පසුව වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම.
2. වායු සමනය කරන ලද කාමරයේ උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 26 ට (26 $^{0}$C) හෝ ඊට වැඩි අගයක සාපේක්ෂ ආර්ද්‍රතාවය 55%- 60% අතර තබා ගත යුතුය. කාමර උෂ්ණත්වය ඉක්මනින් පහත දැමීමේ අපේක්ෂාවෙන් වායු සමීකරණ යන්ත්‍රයේ උෂ්ණත්වය 26 $^{0}$C ට අඩු අගයකට සකස් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස බලශක්තිය වැය වීම ඉහල යයි. වායු සමීකරණ යන්ත්‍රයේ උෂ්ණත්ව සීමාව සෙන්ටිග්‍රේඩ් අංශක 1 කින් ඉහල දැමීම මගින් 4% ක විදුලි ඉතිරියක් ලබා කර ගත හැක.

3. විදුරු මත කෙලින්ම පතනය වන හිරු රැස් මගින් අධික තාපයක් කාමරය තුලට පැමිණෙන නිසා වායු සමනය කරන ලද කාමර වලට එසේ හිරු රැස් වැටෙන අවස්ථාවල තිර රෙදි මගින් අවරණය කිරීම.
4. වායු සමීකරණ යන්ත්‍ර නිසිලෙස නඩත්තු කිරීම සහ වායු පෙරණය මත මනා ලෙස සිදු කිරීම.
5. පරිසර උෂ්ණත්වය අඩු සෑම අවස්ථාවකම ස්වභාවික වාතාශ්‍රය ප්‍රයෝජනයට ගෙන වායු සමීකරණ යන්ත්‍ර වල ක්‍රියාකාරීත්වය හැකි පමණ අඩු කිරීම.
6. කාර්යාලයෙන් පිටවීමට පැය භාගයකට පෙර වායු සමීකරණ යන්ත්‍ර/ පද්ධතිය ක්‍රියා විරහිත කිරීම.
7. හැකි සෑම අවස්ථාවකදීම වායු සමීකරණ යන්ත්‍ර වෙනුවට විදුලි පංකා භාවිතා කිරීම මේස විදුලි පංකා (Table Fan) හෝ සිටුවන විදුලි පංකා (Pedestal Fan) සිවිලිම් විදුලි පංකා වලට වඩා බලශක්ති කාර්යක්ෂමතාවයෙන් ඉහලය.
8. වායු සමීකරණ යන්ත්‍ර මිළදී ගැනිමේදී සෑම විටම ඉන්වර්ටර් (Inverter) සහිත උපකරණ තෝරා ගැනීම.

<u>ශීතකරණයේ කාර්යක්ෂමතාවයට</u>

1. ශීතකරණය ස්ථාන ගත කිරීමේදී බිත්තිය හා ශීතකරණය පිටුපස අතර අගල් 10ක් හෝ ඊට වැඩි පරතරයක් සිටින සේ තබන්න.
2. ශීතකරණය අසල රත්වන උපකරණ භාවිතයෙන් වලකින්න.
3. හිරු එළිය ඍජුව නොවැටෙන ස්ථානයක ශීතකරණය තබන්න.
4. ශීතකරණයේ ඇති භාණ්ඩ පිළිබඳ ලයිස්තුවක් අලවා තැබීමෙන් හා මතකයේ තබා ගැනිමෙන් එහි දොර ඇර තබාගෙන භාණ්ඩ සෙවීමට ගත වන කාළය අවම කර ගත හැක.
5. ශීතකරණයේ දොර ඇරෙන වැසෙන වාර ගණන අඩුකර ගැනීමෙන් වැය වන විදුලිය අඩු කර ගත හැක.
6. ශීත කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය නොමැති විට එය ක්‍රියා විරහිත කර තැබීමද විදුලි බිල අඩුකර ගැනීමට හේතු වනු ඇත.
7. ශීතකරණයේ කාර්යක්ශමතාවයට එහි නඩත්තුව ඉතා වැදගත් වේ.
8. ශීතකරණයේ ඇති රබර් බීඩිම පලුදු වී ඇත්නම් හෝ සණවී ඇත්නම් එහි අලුතින්ම දමන්න.
9. දොර ඉහළ පැත්තේ රබර් බීඩිම තුලට අපද්‍රව්‍ය වැටී ඇත්නම් එහි බීඩිම පිරිසිදු කරන්න.

<u>අනෙකුත් උපකරණ</u>

1. පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර ආදිය භාවිතා නොකරන විට නිද්‍රා අවස්ථාවේ නොතබා ක්‍රියා විරහිත කර තැබීම.
2. තේ සෑදීම සඳහා විදුලිය/ ඉන්ධන භාවිතා කර ජලය රත් කරන විට අවශ්‍ය ප්‍රමාණයට පමණක් ජලය භාවිතා කිරීමට කටයුතු කිරීම
3. අනෙකුත් සියලුම විදුලි උපකරණ ඒවායේ නිෂ්පාදක විසින් නිර්දේශ කර ඇති උපදෙස් වලට අනුකූලව භාවිතා කරන්න.